# <u>ප්‍රසම්පාදන දැන්වීම</u>

## <u>ශ්‍රී ලංකා නාවික හමුදාව</u>

### <u>2018 වර්ෂයේ ජනවාරි මස 01 දින සිට ජූනි මස 30 දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාවට පොදු ගබඩා ද්‍රව්‍ය සැපයීම සඳහා නිෂ්පාදකයන්ගෙන්/ආනයන කරුවන්ගෙන්/සැපයුම් කරුවන්ගෙන්/කොන්ත්‍රාත් කරුවන්ගෙන් ඒකක කොන්ත්‍රාත් මිල ගණන් යටතේ මිල ගණන් කැඳවීම.</u>

1. ශ්‍රී ලංකා නාවික හමුදාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත 2018 ජනවාරි මස 01 වන දින සිට 2018 ජූනි මස 30 වන දින දක්වා පහත දක්වා ඇති වෙන් වෙන් වශයෙන් මිල ගණන් කැඳවීම් වලට අයත් පොදු ගබඩා ද්‍රව්‍යයන් එක් මිල කැඳවුමක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඒකක කොන්ත්‍රාත් මිල ගණන් යටතේ සැපයිය හැකි නිෂ්පාදකයන්, ආනයනකරුවන්, සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ. ඉදිරිපත් කරන මිල ගණන් වල වලංගු කාලය 2018 ජනවාරි මස 01 වන දින සිට 2018 ජූනි මස 30 වන දින දක්වා විය යුතුයි.

අ. තෝරා ගන්නා කොන්ත්‍රාත්කරුවන් නාවික හමුදාව විසින් ඇණවුම් කරනු ලබන ගබඩා ද්‍රව්‍යයන් මාර්ගස්ථ ගබඩාව ශ්‍රීලංනානෞ “මහසෙන්” වැලිසර, රාගම වෙත සැපයුම් කල යුතුය.

ආ. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් එක් එක් කාණ්ඩයන් සඳහා ආපසු නොගෙවනු ලබන රු.2000.00 ක අයදුම්පත් ගාස්තුව මුදලින්, අධ්‍යක්ෂ(මුදල්), ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01 වෙත ගෙවා ලබා ගන්නා ලද ලදු පත අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් සහ සේවා, නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01 වෙත ඉදිරිපත් කර අයදුම්පත් 2017 ඔක්තෝබර් මස 04 වන දින සිට 2017 ඔක්තෝබර් මස 26 වන දින දක්වා සතියේ වැඩකරන දින වල 1000 පැයේ සිට 1400 පැය දක්වා ලබාගත හැකි අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත දක්වා ඇති පරිදි ඉදිරිපත් කල යුතුය.

2. 2018 වර්ෂය සඳහා අවශ්‍ය පොදු ගබඩා ද්‍රව්‍යයන් වල විස්තර සහ දළ අවශ්‍යතා ප්‍රමාණයන් එක් එක් මිල ගණන් කැඳවුම් අනුව අයදුම්පත් සමඟ නිකුත් කරනු ලැබේ.

<u>විෂයය කාණ්ඩයන් සහ අංකයන්</u>

| <u>මිල ගණන් කැඳවුම් කාණ්ඩ අංකය</u> | <u>විෂයය කාණ්ඩ විස්තරය</u> | <u>මිල ගණන් කැඳවීම අවසන් වන දිනය හා විවෘත කරන වේලාව</u> |
|---|---|---|
| එස්එල්එන්/එල්ඔපි/01/ආර්සී/2018 | සියළුම බැටරි වර්ග | 2017 ඔක්තෝබර් 27, 1000 පැය |
| එස්එල්එන්/එල්ඔපි/02/ආර්සී/2018 | එතුම් කම්බි | 2017 ඔක්තෝබර් 27, 1000 පැය |
| එස්එල්එන්/එල්ඔපි/03/ආර්සී/2018 | ගෘහස්ථ විදුලි රැහැන් | 2017 ඔක්තෝබර් 27, 1000 පැය |
| එස්එල්එන්/එල්ඔපි/04/ආර්සී/2018 | ස්විච, එම්සීබී,එම්සීසීබී,ආර්සීසීබී | 2017 ඔක්තෝබර් 27, 1000 පැය |
| එස්එල්එන්/එල්ඔපි/05/ආර්සී/2018 | නාන කාමර කට්ටල | 2017 ඔක්තෝබර් 27, 1000 පැය |
| එස්එල්එන්/එල්ඔපි/06/ආර්සී/2018 | පරිඝණක හා උපාංග | 2017 ඔක්තෝබර් 27, 1000 පැය |
| එස්එල්එන්/එල්ඔපි/07/ආර්සී/2018 | ටයර් සහ ටියුබ් | 2017 ඔක්තෝබර් 27, 1000 පැය |

| | | |
|---|---|---|
| එස්එල්එන්/එල්ඹිපි/08/ආර්සී/2018 | කන්ඩියුට් සහ උපාංග | 2017 ඔක්තෝබර් 27, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/09/ආර්සී/2018 | වානේ කම්බි (ගොඩනැගිලි ඉදිකිරීම්) | 2017 ඔක්තෝබර් 27, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/10/ආර්සී/2018 | කාර්මික කටයුතු සඳහා යොදා ගන්නා වායු වර්ග. | 2017 ඔක්තෝබර් 27, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/11/ආර්සී/2018 | ගොඩනැගිලි ද්‍රව්‍ය විෂයයන් | 2017 ඔක්තෝබර් 30, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/12/ආර්සී/2018 | පිරිසිදු කිරීම සඳහා යොදා ගන්නා සනීපාරක්ෂක විෂයයන් | 2017 ඔක්තෝබර් 30, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/13/ආර්සී/2018 | දුරකථන රැහැන් වර්ග (ගෘහස්ථ) ඩ්‍රොප් වයර් සහ දුරකථන උපකරණ | 2017 ඔක්තෝබර් 30, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/14/ආර්සී/2018 | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය | 2017 ඔක්තෝබර් 30, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/15/ආර්සී/2018 | මුද්‍රණ කඩදාසි හා පොත් පත් | 2017 ඔක්තෝබර් 30, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/16/ආර්සී/2018 | දේශීය ලී වර්ග | 2017 ඔක්තෝබර් 30, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/17/ආර්සී/2018 | පොදු ඉංජිනේරු විෂයයන් | 2017 ඔක්තෝබර් 30, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/18/ආර්සී/2018 | පැස්සුම් කූරු | 2017 ඔක්තෝබර් 30, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/19/ආර්සී/2018 | පීවීසී ජල නල සහ උපාංග | 2017 ඔක්තෝබර් 30, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/20/ආර්සී/2018 | තුනී ලෑලි දේශීය සහ විදේශීය | 2017 ඔක්තෝබර් 30, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/21/ආර්සී/2018 | පොදු තීන්ත | 2017 ඔක්තෝබර් 30, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/22/ආර්සී/2018 | තාර වර්ග | 2017 ඔක්තෝබර් 31, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/23/ආර්සී/2018 | බෙයාරින් වර්ග | 2017 ඔක්තෝබර් 31, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/24/ආර්සී/2018 | විදුලි බුබුළු වර්ග | 2017 ඔක්තෝබර් 31, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/25/ආර්සී/2018 | සෙවිලි තහඩු | 2017 ඔක්තෝබර් 31, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/26/ආර්සී/2018 | මෝටර් රථ තීන්ත | 2017 ඔක්තෝබර් 31, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/27/ආර්සී/2018 | මුද්‍රණ අයිතමයන් | 2017 ඔක්තෝබර් 31, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/28/ආර්සී/2018 | විදේශීය ලී වර්ග | 2017 ඔක්තෝබර් 31, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/29/ආර්සී/2018 | සවිගන්වන ලද වීදුරු කෙඳි (GRP) | 2017 ඔක්තෝබර් 31, 1000 පැය |
| එස්එල්එන්/එල්ඹිපි/30/ආර්සී/2018 | වාහන අමතර කොටස් | 2017 ඔක්තෝබර් 31, 1000 පැය |

3. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය (මිල ගණන් ඇගයීමේදී මෙම කරුණු සැලකිල්ලට ගනු ලැබේ)

අ. පොදු ගබඩා ද්‍රව්‍යයන් සමාන ධාරිතා බලයක් සහිතව රජයේ /පෞද්ගලික ආයතන වෙත සැපයීම පිළිබඳව වර්ෂ 02 ක සතුටුදායක කාර්ය සාධනයක් තිබෙන බවට වාර්ථා.

ආ. ස්ථිර මූල්‍යමය හැකියාව

ඇ. බදු ගෙවීම පිළිබඳ සතුටුදායක වාර්ථා.

ඈ. ප්‍රමාණවත් පරිදි පණිවිඩ හුවමාරු පහසුකම් තිබීම. (දුරකථන, ජංගම දුරකථන, ෆැක්ස් යන්ත්‍ර , ඊමේල්)

ඉ. ප්‍රමාණවත් පරිදි ගබඩා පහසුකම් තිබීම.

ඊ. ප්‍රමාණවත් පරිදි කාර්ය මණ්ඩලයක් සිටීම සහ කාර්යාල පහසුකම් තිබීම.

උ. ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් තිබීම.

ඌ. ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයේ හෝ සංස්ථාපිත සහතිකයේ පිටපතක් ඉදිරිපත් කල යුතුය. එසේ ලියාපදිංචි වීමෙන් පසු ආසන්න වසර 03 ක කාලය තුල අඛණ්ඩව ව්‍යාපාර කටයුතු වල යෙදී සිටි බවට වාර්ථා ඉදිරිපත් කල යුතුය.

4. අයදුම්කරුවන් තම මිල ගණන් ඉදිරිපත් කිරීමේදී වැට් බදු සඳහා ලියාපදිංචි අංකය සඳහන් කර තිබීම අනිවාර්ය්‍ය වේ. වැට් බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් වෙතින් ලබාගත් වැට් බදු ලියාපදිංචියෙන් නිදහස් බවට සනාථ කරන සහතිකයක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. තවද ඉහත අවශ්‍යතාවයන් සපුරා නොමැති මිල ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. අයදුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා නාවික හමුදාවට 2018 වර්ෂය සඳහා පොදු ගබඩා විෂයයන් සැපයීම සඳහා කොන්ත්‍රාත් මිළ ගණන් ඉදිරිපත් කිරීම" (විෂයය කාණ්ඩය) එස්එල්එන්/එල්ඊපී/....../ආර්සී/2018 ටෙන්ඩර් පත් විවෘත කරන දිනය, වේලාව සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ පහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් බහාළුම් පෙට්ටියේ තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය.

**සභාපති,**
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා නාවික හමුදාව
නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ. 593,
කොළඹ 01.

6. මිලගණන් භාරගන්නා අවසාන දිනය හා වේලාව පසුවූ වහාම ලද අයදුම්පත් විවෘත කරනු ලැබේ. අයදුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු හට මිලගණන් විවෘත කරන අවස්ථාවට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, විවෘත කිරීමකින් තොරව ආපසු භාරදෙනු ලැබේ.

7. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද මිලගණන් පත්‍රිකා හා ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද, නිසි පරිදි සහතික නොකරන ලද ටෙන්ඩර් පත්‍රිකාද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම මිලගණන් පතක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

8. තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෙත ගිවිසුම් අත්සන් කිරීම සඳහා ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දෙනු ලැබේ.

9. ටෙන්ඩර් අයදුම්පත් කිසිදු ගෙවීමකින් තොරව අධ්‍යක්ෂක ජෙනරාල් සැපයුම් හා සේවා, නාවික හමුදා මූලස්ථානය, කොළඹ යන ස්ථානයේදී පරීක්ෂා කර බැලිය හැක.

10. වැඩි විස්තර අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් හා සේවා, නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01 දු.අ. 011 2334995, සහ අධ්‍යක්ෂ නාවික සැපයුම් දු.අ. 011 2212326, 011 2212321 වෙතින් ලබාගත හැක.

11. මෙම ඒකක කොන්ත්‍රාත් සඳහා මිල ගණන් කැඳවීම සම්බන්ධ විස්තර නාවික හමුදා වෙබ් අඩවිය www.navy.lk මගින් ද ලබාගත හැක.

**සභාපති,**
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා නාවික හමුදාව
කොළඹ 01